**ශීර්ෂය 263 - හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 263 - හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 අගෝස්තු 01 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**02. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

-----------------

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

----------------------------

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 923.75 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 857.35 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 66.40 ක් හෙවත් සියයට 7.19 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 695.65 | 690.01 | 5.64 | 0.81 |
| මූලධන | 228.10 | 167.34 | 60.76 | 26.64 |
| එකතුව | 923.75 | 857.35 | 66.40 | 7.19 |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙනත් අමාත්‍යාංශ 27 ක් හා දෙපාර්තමේන්තු 16 ක් විසින් එකතුව රු.මිලියන 2,442 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 2,399 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 43 ක් හෙවත් සියයට 1.76 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 26301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 45.60 | 45.15 | 30.60 | 37.26 | 163.00 | 147.63 |

## 2.3 පොදු තැන්පත් ගිණුම්

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන තැන්පත් ගිණුම් 06 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු. මිලියන 599.81 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. මිලියන |
| 6000/0000/00/0011/0598/000 | 300.00 |
| 6000/0000/00/0016/0043/000 | 162.47 |
| 6000/0000/00/0013/0075/000 | 85.14 |
| 6000/0000/00/0017/0014/000 | 50.48 |
| 6000/0000/00/0002/0092/000 | 0.89 |
| 6000/0000/00/0014/0007/000 | 0.83 |
| එකතුව | 599.81 |

**2.4 විගණන නිරීක්ෂණය**

**-----------------------**

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 03 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**-----------------------------------------------**

**3.1 විගණන විමසුම්වලට පිළිතුරු දීම**

**------------------------------------**

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 12 කට සහ ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 03 කට 2016 මාර්තු 31 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. 29,783,610 ක් වී තිබුණි.

**3.2 විසර්ජන ගිණුම**

**----------------**

**වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන**

**--------------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය විසින් ලබාදුන් ප්‍රතිපාදන**

**--------------------------------------------------------------**

ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පෝෂණ මළු මිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියෙන් බැහැරව කටයුතු කිරීම නිසා වැඩි මිල ගණන් යටතේ ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම හේතුවෙන් රු. 370,134 ක වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) **නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය විසින් ලබාදුන් ප්‍රතිපාදන**

**-----------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දොරින් දොරට ගමින් ගමට ගම් 15000 ක් නගා සිටුවීමේ වැඩසටහන දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබුණු විද්‍යාර්ථ විද්‍යාලයේ ආරක්ෂිත දැල් වැට ඉදිකිරීමේ කර්මාන්තයට අදාළ ඇස්තමේන්තු සැකසීමේදී ප්‍රමාණය සහ ඒකක පිරිවැය වැඩිපුර ඇස්තමේන්තු කිරීම හේතුවෙන් රු. 259,920 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

- 2015 මාර්තු 04 දිනැති අංක MHS/RD/VDP/2015 දරන නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශ ලේකම්ගේ ගම් නගා සිටුවීමේ වැඩසටහන - 2015 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු නොකර කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුමක් අත්සන් නොකර උක්ත කර්මාන්තය යටතේ ඉතිරි වූ රු.259,920 ක් වැය කරමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර මාර්ග පද්ධතිය සකස් කර තිබුණි.

- සූරියවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබුණු මහපැලැස්ස සේවා පියස සහිත ඉඩමේ ළමා උද්‍යානයක් ඉදිකිරීමේ කර්මාන්තයට අදාළ පළමු බිල්පතෙහි ඇතුළත් ඉටු නොකළ වැඩ විෂයයන් 03 ක් වෙනුවෙන් රු. 65,904 ක් වැඩිපුර ගෙවා තිබුණි.

- ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් විසින් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා නොගෙන උක්ත වැඩසටහනට අදාළ පරිපාලන වියදම් සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන භාවිතා කරමින් කාර්යාලීය නාමපුවරු සකස් කිරීම වෙනුවෙන් එකතුව රු. 112,392 ක වියදම් කර තිබුණි.

(ii) අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබුණු ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපෘති 03 කට සහ මාර්ග සංවර්ධන ව්‍යාපෘතියකට අදාළ ගෙවීම් බිල්පත්වල ඇතුළත් ඉටු නොකළ වැඩ කොටස් වෙනුවෙන් එකතුව රු. 223,405 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(iii) අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබුණු කලවැල්ල සේවා පියස ඉදිකිරීමේ කර්මාන්තයට අදාළ ඇස්තමේන්තුවේ විෂය අංක 14 යටතේ වූ වැඩ කොටස් ඉටුකිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට රු. 106,561 ක් ගෙවා තිබුණි. නමුත් අදාළ වැඩ කොටස් නියමිත ප්‍රමිතියට අනුව නිම නොකිරීම නිසා ගෙබිම සම්පූර්ණයෙන් ඉරිතලා තිබුණි.

(ඇ) **ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ලබාදුන් ප්‍රතිපාදන**

---

බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබුණු කර්මාන්ත දෙකක වැඩ අවසන් කර ඇති බව සහතික කරමින් 2015 දෙසැම්බර් 31 දින එකතුව රු. 1,140,373 ක චෙක්පත් ලියා අත රඳවාගෙන තිබුණි. 2016 ජනවාරි 12 දින වන විටත් එම කර්මාන්ත වලට අදාළව එකතුව රු. 186,931 ක් වූ වැඩ කොටස් ඉටු නොකර පැවතුණි.

(ඈ) **ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ලබාදුන් ප්‍රතිපාදන**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය විසින් ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය නොකර රු. 79,300 ක් වටිනා සුනාමි අවදානම් අවවාදාත්මක පුවරු 26 ක් සකස් කර තිබුණි.

(ii) වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබුණු ආපදාවන්ට ලක්වීම නිසා හානියට පත් වූ නිවාස සඳහා සහනාධාර ලබාදීමේ වැඩසටහන යටතේ

තෝරාගත් ප්‍රතිලාභීන් තිදෙනෙකු වෙත ලබාදී තිබුණු පළමු වාරික මුදල්වලට අදාළ වැඩ කොටස් ඉටුනොකර තිබියදී ග්‍රාම නිලධාරී විසින් ඉදිරිපත් කර තිබුණු සාවද්‍ය වාර්තා මත පදනම්ව එකතුව රු.150,000 ක දෙවන වාරිකය ගෙවා තිබුණි.

(ඉ) **සමාජ සේවා අමාත්‍යාංශය විසින් ලබාදුන් ප්‍රතිපාදන**

---

වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ආබාධිත පුද්ගලයින් 41 දෙනෙකු සඳහා 2015 දෙසැම්බර් මාසයට අදාළව ගෙවිය යුතු රු. 123,000 ක් අදාළ ප්‍රතිලාභීන් වෙත ලබා නොදී මුදල් භාරගත් බවට ප්‍රතිලාභී අත්සන් ලේඛනය සහිත ගෙවීම් වවුචරය සකස්කර තිබුණි.

(ඊ) **රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය සහ නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය විසින් ලබාදුන් ප්‍රතිපාදන**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දිස්ත්‍රික් ක්‍රමසම්පාදන ලේකම් කාර්යාලය විසින් ජීප් රථයක් අළුත්වැඩියා කිරිම සඳහා රු.708,250 ක් වැය කර තිබුණි. එම අළුත්වැඩියාව කිරිම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව නොවන පරිදි අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ii) ඉහත සඳහන් ජීප් රථය අළුත්වැඩියා කිරීමේදී යාන්ත්‍රික ඉංජිනේරු විසින් නිර්දේශ කර නොතිබුණු අයිතම 16 ක් අළුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.151,950 ක් ගෙවා තිබුණි.

## 3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

---

විෂය අංක 26301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කර තිබුණු සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.4,407,694 ක්වූ අතර , එයින් 2016 ජූලි 31 දින වන විට එකතුව රු.1,579,751 ක් වූ හිඟහිටි ශේෂ වර්ෂ 02 ක සිට වර්ෂ 20 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත් වී තිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මුදල් රෙගුලාසි ප්‍රකාරව ණය හා අත්තිකාරම් ශේෂ දැක්වෙන කේවල ගිණුම් ශේෂ ලේඛනය පිළියෙල කර නොතිබුණි.

(ඇ) 2008 වර්ෂයේ විශ්‍රාම ගිය නිලධාරීයෙකුගෙන් 2016 ජූලි 31 දින වන විට අයවිය යුතු රු.187,408 ක ණය ශේෂය වර්ෂ 7 කට වැඩි කාලයක සිට අයකර ගැනීමට නොහැකි අක්‍රීය ණය ශේෂයක් ලෙස පැවතුණි.

(ඇ) 1996 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලය තුළදී සේවය අතහැර ගිය නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.270,405 ක ණය ශේෂ වර්ෂ 02 ක සිට වර්ෂ 19 ක් දක්වා

කාල පරාසයක් තුළ අක්‍රීය ණය ශේෂ ලෙස පවතින නමුත්, ඇපකරුවන්ගෙන් හෝ අදාළ ණය ශේෂ අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) 1995 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාලය තුළදී වැඩ තහනමට ලක් වූ නිලධාරීන් 07 දෙනෙකුගෙන් 2016 ජූලි 31 දිනට අයවිය යුතු එකතුව රු. 1,121,938 ක ණය ශේෂ වර්ෂ 04 ක සිට වර්ෂ 20 ක් දක්වා කාලපරාසයක අක්‍රීය ණය ශේෂ ලෙස පවතින නමුත්, ඇපකරුවන්ගෙන් හෝ එම ණය ශේෂ අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

**වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභා ගත කළ යුතු වුවත් , 2015 වර්ෂයේ එම වාර්තාව 2016 ජූලි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 3.5 වත්කම් කළමනාකරණය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

### (අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත වර්ග කර දක්වා ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | වටිනාකම රු. | නිෂ්ක්‍රීය හෝ ඌණ උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|---|
| (i) | ගොඩනැගිලි | 01 | ඉදිරිපත් කර නොතිබුණි | වර්ෂ 4 ක සිට |
| (ii) | මෝටර් වාහන | 04 | - එම - | වර්ෂ 01 ක සිට වර්ෂ 10 ක් දක්වා |
| (iii) | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 10 | - එම - | වර්ෂ 14 කට වැඩි කාලයක් දක්වා |

### (ආ) බේරුම් නොකළ බැරකම්

2015 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වර්ෂ 1 ට වඩා අඩු කාලයක සිට පැවත එන බේරුම් නොකළ රු.1,034,043 ක බැරකම් පැවතුණි.

**3.6 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | | වටිනාකම | අනුකූල නොවීම් |
|---|---|---|---|---|
| | | | රු. | |
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| | (i) | මුදල් රෙගුලාසි 137 - 139 හා 237 | 9,701,138 | වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මැනුම්පත්‍ර හා බිල්පත් ඉදිරිපත් නොවූ කොන්ත්‍රාත් 11 ක් වෙනුවෙන් 2015 දෙසැම්බර් මාසයේදී වවුචර්පත් සකස් කර චෙක්පත් ලියා 2016 ජනවාරි 11 දින වන විටත් අත රඳවා ගෙන තිබුණි. |
| | | | 3,198,203 | අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සතුටුදායක ලෙස වැඩ නිම කර ඇති බවට සහතිකයක් ලබා නොගෙන ඉටු නොකළ වැඩ සඳහා 2015 දෙසැම්බර් මාසයේදී චෙක්පත් 18 ක් ලියා 2016 පෙබරවාරි 02 දින වන විටත් අත රඳවා ගෙන තිබුණි. |
| | | | 993,150 | අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2015 දෙසැම්බර් මාසයේදී අසම්පූර්ණ ගනුදෙනු සඳහා සහ ගබඩාවට ලැබී නොතිබුණු භාණ්ඩ වෙනුවෙන් චෙක්පත් 24 ක් ලියා 2016 පෙබරවාරි 02 දින වන විටත් අත රඳවා ගෙන තිබුණි. |
| | (ii) | මුදල් රෙගුලාසි 215 (1) හා 237 | 1,032,054 | කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත සපයා නොතිබුණු භාණ්ඩ වෙනුවෙන් 2015 දෙසැම්බර් 31 දින සැපයුම්කරුවන්ගේ නමට චෙක්පත් 09 ක් ලියා 2016 පෙබරවාරි 23 දින වන විටත් අත රඳවා ගෙන තිබුණි. |

(ආ) **භාණ්ඩාගාර චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 2001 සැප්තැම්බර් 24 දිනැති අංක 95 දරන චක්‍රලේඛය | 736,287 | පළාත් සභා හා ව්‍යවස්ථාපිත ආයතන වෙත ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ එකවර චෙක්පත් මගින් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

(ඇ) **වෙනත් ලිපි**

| | | |
|---|---|---|
| 2010 ඔක්තෝබර් 20 දිනැති අංක 02/06/02/06(viii) GSHB දරන පරිසර අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය | - | ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වාණිජමය කාර්යයන් සඳහා පස් කියුබ් 200 ක් කැනීම් කර ප්‍රවාහනය කිරීම සඳහා පෞද්ගලික ඉදිකිරීම් ආයතනයක් වෙත බලපත්‍ර නිකුත් කිරීමට නිර්දේශ ලබාදී තිබුණි. |

## 3.7 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

(අ) **ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2015 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබුණු ඇස්තමේන්තු පිරිවැය රු. 6,198,625 ක් වූ ව්‍යාපෘති 43 ක් අධික වර්ෂාව හා වෙනත් හේතු මත ආරම්භ කර නොතිබුණි.

(ආ) **ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඇස්තමේන්තුගත පිරිවැය රු. 357,977 ක් වූ ව්‍යාපෘති 03 ක් 2015 වර්ෂයේදී ආරම්භ කර තිබුණු නමුත් විවිධ හේතු මත එම ව්‍යාපෘති නිම නොකර අත්හැර තිබුණි.

## 3.8 අවිධිමත් ගනුදෙනු

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) **රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාපටිපාටියෙන් බැහැරවීම**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(i) ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2015 වර්ෂයේදී එකතුව රු. 3,458,587 ක් වූ ප්‍රසම්පාදන කටයුතු 03 කට අදාළ තීරණ ගැනීමේදී ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් කිසිවෙකු සහභාගී වී නොතිබුණි.

(ii) ඉහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 වර්ෂයේදී වෙළඳපල මිල සැඳැහුම් ක්‍රමය යටතේ එකතුව රු. 5,304,370 ක් වූ මිලදී ගැනීම් 34 ක් සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 මාර්ගෝපදේශයේ දක්වා තිබුණු අවශ්‍යතාවයෙන් බැහැර වී ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා නොතිබුණි.

(iii) යොමුගත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 අගෝස්තු මාසයේදී රු.5,425,574 ක ගොඩනැගිලි ද්‍රව්‍ය මිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 මාර්ගෝපදේශයට අනුකූල නොවී මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා දින 05 ක කාලසීමාවක් පමණක් ලබාදී තිබුණි.

**(ආ) අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

-------------------------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු වෙත ලබාදී ඇති අධිකාරය බලය ඉක්මවා යමින් ඕකෙවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2015 මාර්තු මාසයේ සිට ජුනි මාසය දක්වා කාලයට අදාළ පෝෂණ මළු මිලදී ගැනීම සඳහා රු.1,862,795 ක් වැයකර තිබුණි.

**3.9 පාඩු හා හානි**

--------------

1987 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ක සිද්ධීන් 35 කින් එකතුව රු.19,451,377 ක් වූ පාඩු හා හානි සිදු වී තිබුණු නමුත්, ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 109 පරිදි සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**3.10 අනාර්ථික ගනුදෙනු**

----------------------

නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) නියඟයෙන් පීඩාවට පත්ව සිටින ජනතාවට ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ජල බඳුන් බෙදාදීමේ ව්‍යාපෘතිය යටතේ දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලබාදී තිබුණු ලීටර් 20 ජල බූලි 7,012 ක ප්‍රමාණයක් අස්ථානගත වී තිබුණි.

(ආ) Oxfam Sri Lankan ගෙවතු වගා වැඩසටහන යටතේ තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලැබී තිබුණු රු. 1,146,620 ක ගෙවතු වගා උපකරණ කට්ටල 218 ක් විධිමත් ආරක්ෂාවකින් තොරව එළිමහනේ ගබඩා කර තිබීම නිසා රු.45,425 ක් වටිනා උපකරණ අස්ථානගත වී තිබුණි.

(ඇ) සූරියවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මහජන නියෝජිතයින්ගේ සංවර්ධන වැඩසටහන - 2014 යටතේ 2014 දෙසැම්බර් 30 දින මිලදී ගෙන තිබුණු රු. 462,000 ක් වටිනා විදුලි මෝටරය සහිත සිංගර් සාමාන්‍ය රෙදි මහන යන්ත්‍ර 20 ක් 2016 ජුනි මාසය වන විටත් ප්‍රතිලාභීන් වෙත බෙදා නොහැර ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(ඈ) තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා නොගෙන ප්‍රාදේශීය ලේකම්වරයාගේ අනුමැතිය මත නියඟයෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලසීමේ කඩිනම් සංවර්ධන වැඩසටහනේ පරිපාලන වියදම් සඳහා වෙන්කර තිබුණු

ප්‍රතිපාදනවලින් රු.96,750 ක් නිලධාරීන්ගේ සුහද හමුවක් පැවැත්වීම සඳහා ප්‍රදේශයේ පෞද්ගලික හෝටලයක් වෙත ගෙවා තිබුණි.

(ඉ) තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මහජන නියෝජිතයන්ගේ විශේෂ සංවර්ධන වැඩසටහන් යටතේ 2013 සහ 2014 යන වර්ෂවලදී මිලදී ගෙන තිබුණු භාණ්ඩ වලින් රු.678,555 ක් වටිනා භාණ්ඩ 2015 නොවැම්බර් 26 දින වන විටත් ප්‍රතිලාභීන් වෙත බෙදාදීමට කටයුතු කර නොතිබුණි.

**3.11 කළමනාකරණ දුර්වලතා**

---------------------------

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් විසින් ලියාපදිංචි කර තිබුණු ඉඩම් දීමනා පත්‍ර 610 ක් හා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි නොකළ ඉඩම් දීමනා පත්‍ර 337 ක් ඒවායේ හිමිකරුවන් වෙත බෙදාදීමට කටයුතු නොකර වර්ෂ 01 ක සිට වර්ෂ 32 ක් දක්වා අතර කාලසීමාවක් රඳවාගෙන තිබුණි.

**3.12 මානව සම්පත් කළමනාකරණය**

--------------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

------------------------------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 46 | 40 | 07 | 01 |
| (ii) | තෘතීයික මට්ටම | 35 | 13 | 22 | - |
| (iii) | ද්විතීයික මට්ටම | 1,052 | 1,007 | 92 | 47 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 116 | 115 | 07 | 06 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 02 | - | 02 |
| | එකතුව | 1,249 | 1,177 | 128 | 56 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂය අවසාන වන විට මට්ටම් 03 ක තනතුරුවල 54 ක අතිරික්ත සේවක සංඛ්‍යාවක් සිටියද , එම තනතුරු විධිමත් කර ගැනීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත නොවූ තනතුරු 02 ක අතිරික්ත සේවකයින් දෙදෙනෙකු සේවයේ යොදවා ඇති බව නිරීක්ෂණය විය.